# සභාග රජය ගැන බෞද්ධ ජාතික බලවේගයෙන් රැස්වීමක්...

**බෞ**ද්ධ ජාතික බලවේගය හැටේ දශකයේදී ශ්‍රී ලංකාවේ ජාතික හා දේශපාලන කටයුතු කෙරෙහි විශේෂ බලපෑම් ඇති කළ සංවිධානයකි. එහි සභාපතිවරයා වූයේ කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පතිව සිටි ඇල්. එච්. මෙත්තානන්ද මහතාය. උප සභාපතිවරුන් අතර නිශ්ශංක විජේරත්න (හිටපු ස්ථිර ලේකම්, අධ්‍යාපන අමාත්‍ය, දියවඩන නිලමේ), ටී. යූ. ද සිල්වා යන මහත්වරු සිටියහ. සංවිධායක ලේකම් වූවේ ප්‍රේමචන්ද්‍ර ද සිල්වා මහතා (සමස්ත ලංකා රජයේ ලිපිකරු සංගමයේ හිටපු සභාපති) ය.

මා එවකට සේවය කළේ බණ්ඩාරවෙල දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේය. බෞද්ධ ජාතික බලවේගය හා අනුබද්ධිතව "බණ්ඩාරවෙල මධ්‍යම බෞද්ධ බල මණ්ඩලය" පිහිටුවීමට කටයුතු කළේ එම කාලයේදීය. එවකට බණ්ඩාරවෙල කහගත්තේවෙල විදුහල්පති වූ අ.බෝ. මිහිඳුතිස් මහතා සභාපතිවරයා වූ අතර උප සභාපතිවරුන් අතර ආර්. ඇම්. අප්පුහාමි (පසු කලෙක බණ්ඩාරවෙල පාර්ලිමේන්තු මන්ත්‍රී), ඊ.ආර්.ඇම්. පියසේන (පසු කලෙක බණ්ඩාරවෙල නගරාධිපති) ඒකනායක නොතාරිස් රාළහාමි, ඩයස් මුදලාලි යන මහත්වරු සිටියහ.

මා එහි ප්‍රධාන සංවිධායක ලේකම් වූ අතර ක්‍රියාකාරීන් අතර ඒ.කේ. වික්‍රමසිංහ, සු. බ.නෙල්ලිපොල, ඩබ්ලිව්. ඇම්. ඕ. වික්‍රමපාල, ඩී. ඩබ්ලිව්. තිලකරත්න යන මහත්වරු ද සිටියහ. නගර වැසි, ගම්වැසි, ප්‍රදේශවාසී බොහෝ දෙනකුගේ සහයෝගය මධ්‍ය බෞද්ධ බල මණ්ඩලයට ලැබුණි.

1960 ජූලි මහ මැතිවරණයෙන් පසුව සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිණියගේ නායකත්වයෙන් පිහිටුවන ලද රජය මගින් රටේ පාලන කටයුතු ගෙන ගිය අතර සභාග රජයක් පිහිටුවීමේ අදහසක්ද ඒ වන විට ඉදිරිපත් වී තිබුණි. බෞද්ධ ජාතික බලවේගයේ ප්‍රසිද්ධ මහජන රැලියක් 1963 සැප්තැම්බර් මස 15 වැනිද බණ්ඩාරවෙල නගර ශාලාවේදී පැවැත්වීමට සංවිධාන කළේ මධ්‍යම බෞද්ධ බල මණ්ඩලයයි.

එහෙත් ඊට දින කීපයකට පෙර ලංකා කම්කරු කොන්ග්‍රසය විසින් බණ්ඩාරවෙල නගර ශාලාවේදී රැස්වීමක් පැවැත්වීමට සූදානම් කර තිබුණි. එම රැස්වීමට පෙර නගරය හරහා ගමන් කළ ඔවුන්ගේ පෙළපාලියකදී ඇතිවූ සිදුවීම් නිසා නගරයේ කලබලකාරී තත්ත්වයක් ඇති විය. පිටස්තර පොලිසිවලින් කණ්ඩායම් ගෙන්වා තත්ත්වය පාලනය කිරීමට ප්‍රදේශයේ පොලිස් බලධාරීන්ට මේ නිසා සිදුවිය.

මේ නිසා අපගේ පෙරහරටද අවසරදීම ප්‍රතික්ෂේප කළ නමුත් පසුව අවසර ලැබුණි. තන්තිරිය හන්දියේ සිට නගර ශාලාව දක්වා පැමිණි දර්ශනීය පෙරහරකින් පසුව පැවැත් වූ මහා සභා රැස්වීම අමතා නිශ්ශංක විජේරත්න, කේ. එච්. එම්. සුමතිපාල, ප්‍රේමචන්ද්‍ර ද සිල්වා යන මහත්වරු දේශන පැවැත්වූහ. එදින අවට නගරය සිසාරා ද සෙනග රැස්වූ අතර නගර ශාලාවෙන් බැහැරට ද ශබ්ද විකාශන යන්ත්‍ර යොද තිබුණි.

ප්‍රදේශයේ විවිධ ජාතිකාගමික වැඩ සටහන් මෙහෙයවීමට ද සහභාගිවීමට ද ඉදිරිපත් මධ්‍යම බෞද්ධ බල මණ්ඩලය මගින් දේශපාලනමය වශයෙන් වැදගත් ප්‍රකාශනයක් කිරීම සඳහා වූ මහා සභා රැස්වීම සංවිධානය කළේ 1964 මුල් භාගයේදීය.

එම රැස්වීම පවත්වන ලද්දේ බණ්ඩාරවෙල සීවලී මහා විදුහලේදීය. ප්‍රදේශයේ පාසල් සිසුන් අතර පැවැත්වූ බෞද්ධ චිත්‍ර තරගයකදී ඉදිරිපත් කළ චිත්‍ර පූජ්‍ය මාපලගම විපුලසාර හිමිපාණන්ගේ චිත්‍රද ඇතුලත් බෞද්ධ චිත්‍ර ප්‍රදර්ශනයක් මහා සභා රැස්වීමට පෙර සීවලී විදුහලේදී පවත්වන ලදී. ඒ සඳහා බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේද, බල මණ්ඩලයේ සභිකයන් වූ විදුහල්පති පී. සී. රත්නායක, රියලිස්ට් ඡායාරූප ශාලාධිපති විජේසිංහ යන මහතුන්ගේද නොමඳ සහයෝගය ලැබුණි.

1964 අප්‍රේල් 26 වැනි ඉරු දින දියතලාවේ සුධර්මාලංකාර පරිවෙනාධිපති පූජ්‍ය පණ්ඩිත දඹවින්නේ සුමනසාර නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ මහා සභා රැස්වීම අමතා ටී. යූ. ද සිල්වා, කේ. එච්. ඇම්. සුමතිපාල යනාදී මහත්වරු දෙසුම් පැවැත්වූහ.

එහිදී බෞද්ධ ජාතික බල වේගයේ සභාපති ඇල්. එච්. මෙත්තානන්ද මහතා විසින් ජනතාව වෙත ඉදිරිපත් කරන ලද විශේෂ ප්‍රකාශය 1964 අප්‍රේල් 27 සඳුද "දිනමිණ" පත්‍රයේ පළ විය.

මෙම තොරතුරු ඉදිරිපත් කළේ මධ්‍යම බෞද්ධ මණ්ඩලයේ ප්‍රධාන සංවිධායක ලේකම්ව සිටි

***විමල් රෝහණ විතානාච්චි***



ටී. යූ. ද සිල්වා මහතා සභාව අමතමින්






ඇල්. එච්. මෙත්තානන්ද මහතා විශේෂ ප්‍රකාශය ඉදිරිපත් කිරීම.

දිවයින 29/1/04